Embassy of the Democratic
Socialist Republic of Sri Lanka
P.O Box 46534
Abu Dhabi - United Arab Emirates
Tel : 00971 2 6316444 Fax : 00971 2 6331661
Email : lankemb@emirates.net.ae

سفارة جمهورية سري لانكا
الديمقراطية الإشتراكية
ص. ب. ٤٦٥٣٤
أبوظبي - دولة الإمارات العربية المتحدة
هاتف : ٠٠٩٧١٢٦٣١٦٤٤٤ فاكس : ٠٠٩٧١٢٦٣٣١٦٦١
البريد الإلكتروني : lankemb@emirates.net.ae

# දැන්වීමයි

## තානාපති කාර්යාලය හරහා විදේශ කටයුතු අමාත්‍යංශයේ ලේඛන සත්‍යාපනය සිදුකිරීම (e-DAS සේවාව)

විදේශ කටයුතු අමාත්‍යංශයේ කොන්සියුලර් අංශය මගින් සිදු කරනු ලබන ලිපිලේඛන සත්‍යාපනය (සහතික) කිරීමේ සේවාව 2019 ජනවාරි 01 දින සිට අබුඩාබි තානාපති කාර්යාලය හරහා සිදුකර ගතහැකි බව දන්වා සිටිමු.

විදේශ කටයුතු අමාත්‍යංශයේ කොන්සියුලර් අංශය වෙතින් ලිපිලේඛන සත්‍යාපනය කිරීමට අවශ්‍ය සියලුම අයදුම්කරුවන් (ශ්‍රී ලාංකික හා ශ්‍රී ලාංකික නොවන) අදාළ ලිපිලේඛන අබුඩාබි තානාපති කාර්යාලය වෙත භාරදීම මගින් එම සේවාව ලබා ගතහැකිය. එසේම ලේඛන සත්‍යාපනය ක්‍රියාවලියේදී විදේශ කටයුතු අමාත්‍යංශය හැර අනෙකුත් ආයතන වලින් සිදුකර ගතයුතු සහතික කිරීම් පෙර පරිදිම අයදුම්කරුවන් විසින්ම අදාළ ආයතන වලින් සිදුකර ගත යුතු බව කාරුණිකව දන්වා සිටිමු.

වැදගත්:

- අසම්පූර්ණ ලියවිලි සත්‍යාපනය කිරීම සඳහා භාර නොගනී.
- ජයා පිටපත් සත්‍යාපනය කිරීම සිදුනොකරයි.
- 2008 පසු ලබාගන්නා ලද උප්පැන්න, විවාහ, හා මරණ සහතික පමණක් සත්‍යාපනය කිරීම සඳහා භාරගනු ලබයි.

වැඩි විස්තර සඳහා පහත යොමුව වෙත පිවිසෙන්න
https://www.mfa.gov.lk/consular types/documents-attestation/

අදාළ ගාස්තු

ඩිරාම් - **95** ( ශ්‍රී ලාංකික)

ඩිරාම්- **130** (ශ්‍රී ලාංකික නොවන )

කොන්සියුලර් අංශය
ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
අබුඩාබි
දුරකතන 026316444 /026352460
2019.01.22